# කුරුළු ගෙදර



ඒ.එම්.මහී ෂෙනාලි ආදිත්‍යා කුමාරිහාමි අත්තනායක

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

***මාගේ ආදරණීය,***

***අම්මාට...***

***අප්පච්චිට...***

***දයාබර ගුරුතුමියට***

***සෙනෙහසින් පිළිගන්වමි...!***



**-කුරුළු ගෙදර-**

දවසක් මමයි අක්කයි නංගියි මිදුලේ සෙල්ලම් කරමින් සිටියා.අපේ මිදුලේ නුග පැළයකට ලස්සන කුරුළු ජෝඩුවක් එනවා අපි දැක්කා.එයාලා කතා කරනවා අපි අහගෙන හිටියා.

කුරුළු තාත්තා කිවුවා ,

“අපි මෙතන පොඩ්ඩක් සුද්ධ කරලා බලමුද අපේ ගෙදර හදන්න පුළුවන්ද කියලා”.කුරුළු අම්මා කියනවා “මම බැලුවා මෙතන හොඳයි ආරක්ෂා සහිතයි.

එහෙම නම් අපි ගෙදර සාදන්න පටන් ගමු.වැස්සත් නැහැනේ ” කියලා.

දෙදෙනාම එකතුව කඩිසරව ගේ හදන්න පටන් ගත්තා.

චූටි කුරුළු හොටෙන් වියලි කෝටු, වේළුනු තණ කොළ, පුළුන්, ආදිය ගේනවා අපි දැක්කා.

එදා දවස අවසන් වීගෙන යන බව අපට දැනුනා. අවට කළුවර වුනා. ඉර බැහැගෙන ගියා හෙමිහිට.

අපි නැවතත් හැන්දෑවේ මේ කුරුළු කූඩුව බලන්න ආවා.කුරුළු අම්මයි තාත්තයි ලස්සන ගෙයක් සාදා තිබුනා.

වැඩ ඉවර වෙලා තිබුනේ නැහැ.ඒත් එයාලා හරිම සතුටින් ගෙදර සකස් කරමින් සිටියා. කුරුළු තාත්තා කියනවා ඇහුනා,“අද නම් හරිම වෙහෙසයි,බඩගිනියි,ඒත් හිතට හරි සතුටක් දැනෙනවා කියලා.”

කුරුළු අම්මත් කියනවා “ඔව් ඔව් අද නම් හරිම සතුටුයි මහන්සිය බඩගින්න දැනුනෙම නැහැ.”

“හොඳයි මම දැන් මොනවා හරි කෑම ටිකක් සොයාගෙන එන්නම්.මා එනතුරු ගෙදර වැඩ පුළුවන් දෙයක් කරන්න.” කියලා කුරුළු තාත්තා කිව්වා.

"හොඳයි ඔයා යන්න පරිස්සමට ඉක්මනට එන්න." කියලා කුරුළු අම්මා කිව්වා.

කුරුළු  අම්මා බොහොම කඩිසරව ගේ වටේ ඇවිදිමින්

කූඩුව ඇතුලේ ඇවිදමින් අඩුපාඩු සොයා බලමින් ,

ගෙදර ලස්සන කලා.පුංචි හුරතල් කූඩුවක් අපි දැක්කා.

කුරුළු තාත්තයි අම්මයි දෙන්නා

එදාම ගෙදර නතර වුනා

.කිචි..බිචි.. කියන සද්දේ අපට නිතරම ඇසුනා. එයාලා සතුටින් ඉන්න බව අපට දැනුනා.

අපිත් එයාලට කෑම

දුන්නා,වතුර දුන්නා.

අපි ආදරයෙන් ඒ කූඩුව

බලාගත්තා.පූසාට,කපුටන්ට,රිලවු

න්ට ඒ ගෙදර විනාශ කරන්නට ඉඩ

දුන්නේ නැහැ.

ටික දවසකින් කුරුළු පැටව්

කෑගසනවා අපට ඇසුනා. අම්මයි,

තාත්තයි දෙන්නා ඉක්මනින් කෑම

සොයාගෙන විත් එයාලට කෑම

කවනවා අපි දැක්කා.

එක දවසක අපට ඇහුනා බොහොම

ශබ්දයෙන් එයාලා කෑගසනවා.

මොකද කියලා බලනකොට අපි

දැක්කේ කුරුළු පැටව් ඉගිලිලා යන්ට

එළියට ඇවිත් බව. අත්තෙන් අත්තට පනිමින් තටු සලමින් උඩ පැන පැන කෑගසමින් සෙල්ලම් කරමින් එයාලා සතුටෙන් සිටියා.

කුරුළු තාත්තයි, අම්මයි කීවා "එයාලට කන්න දුන්නාට ආදරයෙන් බලා ගත්තට, ආරක්ෂා කර ගත්තට ඔයාලට බොහොම ස්තූතියි. අද අපි සතුටින් යනවා" කීවා.අපිටත් සතුටුයි අපිත් කිව්වා.

ඔයාලා ළඟ තියෙන එකමුතුකම, ආදරය,අපට කියලා දුන්නට ස්තූතියි කියලා.

නිමි....

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්